සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2015 ஓகஸ்ற்

**කෘෂි විද්‍යාව I**
விவசாய விஞ்ஞானம் I
Agricultural Science I

**08 S I**

**පැය දෙකයි**
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ගබඩා කර ඇති බීජවල ආයු කාලය සඳහා බලපාන වඩාත් වැදගත් සාධක දෙක වනුයේ,
(1) වර්ෂාපතනය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවයි.
(2) බීජවල ප්‍රමාණය සහ තෙතමන ප්‍රමාණයයි.
(3) දේශගුණය සහ උෂ්ණත්වයයි.
(4) සාපේක්ෂ ආර්ද්‍රතාව සහ උෂ්ණත්වයයි.
(5) ආලෝකය සහ බීජයේ තෙතමන ප්‍රමාණයයි.

**2.** බොහෝ බීජවල සුප්තතාව බිඳ දැමිය හැක්කේ,
(1) ආලෝකයට නිරාවරණය කිරීමෙනි.
(2) සීතලට නිරාවරණය කිරීමෙනි.
(3) තෙතමනයට නිරාවරණය කිරීමෙනි.
(4) නිර්වායු තත්ත්වවලට නිරාවරණය කිරීමෙනි.
(5) පාරජම්බුල ආලෝකයට නිරාවරණය කිරීමෙනි.

**3.** පාසල් කාලගුණික මධ්‍යස්ථානයක, අනිලමානය යොදා ගනු ලබන්නේ,
(1) දිවා දිග මැනීමට ය.
(2) සුළඟේ වේගය මැනීමට ය.
(3) පාංශු තෙතමනය මැනීමට ය.
(4) ආලෝක තීව්‍රතාව මැනීමට ය.
(5) වාෂ්පීකරණ උත්ස්වේදනය මැනීමට ය.

**4.** එක්තරා උෂ්ණත්වයක දී වාතයේ අඩංගු සත්‍ය ජල වාෂ්ප ප්‍රමාණය, එම වාතයට එම උෂ්ණත්වයේ දී උපරිම වශයෙන් දැරිය හැකි ජල වාෂ්ප ප්‍රමාණයට අනුපාතයක් ලෙස ගණනය කර එය ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට හඳුන්වනු ලබන්නේ,
(1) විශිෂ්ට ආර්ද්‍රතාව ලෙස ය.
(2) සාපේක්ෂ ආර්ද්‍රතාව ලෙස ය.
(3) නිරපේක්ෂ ආර්ද්‍රතාව ලෙස ය.
(4) සංවේද්‍ය උෂ්ණත්වය ලෙස ය.
(5) තුෂාර අංක උෂ්ණත්වය ලෙස ය.

**5.** කිණකය යනු,
(1) කලල ඇති කරනු ලබන පටකයකි.
(2) රෝපණය සඳහා යොදා ගන්නා ශාක කොටසකි.
(3) අසංවිධානාත්මක සක්‍රීය ව විභාජනය වන සෛල සමූහයකි.
(4) පුවර්කය මගින් නිපදවනු ලබන අද්‍රාව්‍ය කාබොහයිඩ්රේට් වේ.
(5) පටක රෝපණයේ දී ප්‍රරෝහ ඇති කිරීම සඳහා යොදා ගනු ලබන රසායනික ද්‍රව්‍යයකි.

**6.** සතුන්ගෙන් මිනිසාට බෝ වන රෝගයකට උදාහරණයක් වනුයේ,
(1) කුරුළු උණ ය.
(2) ඇන්ත්‍රැක්ස් ය.
(3) කුකුළු වසූරිය ය.
(4) පුල්ලෝරම් ය.
(5) කුර හා මුඛ රෝගය ය.

**7.** ප්‍රාථමික කෘෂිකාර්මික නිෂ්පාදනවල වෙළෙඳපොළ ව්‍යුහය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
(1) කතිපයාධිකාරයක් ලෙස ය.
(2) ඒකාධිකාරයක් ලෙස ය.
(3) තරගකාරී වෙළෙඳපොළක් ලෙස ය.
(4) පූර්ණ තරගකාරී ලෙස ය.
(5) ඒකාධිකාරී තරගයක් ලෙස ය.

**8.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩි ම කුකුළු ගහණයක් දක්නට ලැබෙන්නේ,
(1) කෑගල්ල දිස්ත්‍රික්කයේ ය.
(2) කළුතර දිස්ත්‍රික්කයේ ය.
(3) කොළඹ දිස්ත්‍රික්කයේ ය.
(4) ගම්පහ දිස්ත්‍රික්කයේ ය.
(5) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ය.

**9.** උපතේ සිට පළමු සතිය තුළ ගව පැටියකුට සැපයිය යුතු කිරි ප්‍රමාණය එම සතාගේ දේහ බරෙහි ප්‍රතිශතයක් ලෙස,
(1) 2.5% විය යුතු ය.
(2) 5.0% විය යුතු ය.
(3) 7.5% විය යුතු ය.
(4) 10.0% විය යුතු ය.
(5) 12.5% විය යුතු ය.

[දෙවැනි පිටුව බලන්න.

**10.** පසක ප්‍රධාන කාබනික සබැඳුම් කාරකය වනුයේ,
(1) ලිපිඩ ය. (2) පෙක්ටින් ය. (3) ප්‍රෝටීන් ය.
(4) කාබනික අම්ල ය. (5) පොලිසැකරයිඩ ය.

**11.** ස්වාභාවික වාසස්ථානයක් තුළ දී ම ප්‍රවේණික සම්පත් සංරක්ෂණය කිරීම නම් කරනුයේ,
(1) ස්ථානීය සංරක්ෂණය ලෙස ය. (2) බහිෂ් සංරක්ෂණය ලෙස ය.
(3) *In-vivo* සංරක්ෂණය ලෙස ය. (4) *Ex-vivo* සංරක්ෂණය ලෙස ය.
(5) ජෛව විවිධත්ව සංරක්ෂණය ලෙස ය.

**12.** පසෙහි ඇති ක්ෂුද්‍රජීවීන් අතුරෙන්, වැඩි ම ජෛව ස්කන්ධය සමන්විත වන්නේ,
(1) වයිරසවලිනි. (2) දිලීරවලිනි. (3) ඇල්ගීවලිනි.
(4) බැක්ටීරියාවලිනි. (5) ඇක්ටිනොමයිසිටේස්වලිනි.

**13.** '*pf* අගයෙන්' නියෝජනය වන්නේ,
(1) පසක මුළු ආම්ලිකතාවයි. (2) පසක හුවමාරු කළ හැකි ආම්ලිකතාවයි.
(3) පස ජලයට බැඳී ඇති ශක්තියයි. (4) පාංශු ද්‍රාවණයක අඩංගු $H^+$ සාන්ද්‍රණයයි.
(5) පසක ක්ෂුද්‍රජීවී ජෛව ස්කන්ධයයි.

**14.** ශාකයකට Fe හා Mg අවශ්‍ය වන්නේ,
(1) ඔක්සින් සංශ්ලේෂණයට ය. (2) හරිතප්‍රද සංශ්ලේෂණයට ය.
(3) ඛනිජ සක්‍රිය අවශෝෂණයට ය. (4) කාබොහයිඩ්‍රේට් පරිසංක්‍රමණයට ය.
(5) පූටිකා වැසීම හා විවෘත වීමට ය.


**15.** වර්ධක ප්‍රචාරණය,
(1) ස්වාභාවික ව සිදු වන අතර ප්‍රවේණික ව සර්වසම ශාක නිපදවයි.
(2) කෘත්‍රිම ව සිදු වන අතර ප්‍රවේණික ව සර්වසම ශාක නිපදවයි.
(3) කෘත්‍රිම ව සිදු වන අතර ප්‍රවේණික ව වෙනස් ශාක නිපදවයි.
(4) ස්වාභාවික ව හා කෘත්‍රිම ව සිදු වන අතර ප්‍රවේණික ව සර්වසම ශාක නිපදවයි.
(5) ස්වාභාවික ව හා කෘත්‍රිම ව සිදු වන අතර ප්‍රවේණික ව වෙනස් ශාක නිපදවයි.

**16.** ශාක අභිජනනයේ දී, සංසේචනයෙන් පසු පුෂ්ප මංජරියට බෑගයක් යොදනු ලබන්නේ,
(1) ස්වපරාගණය වැළැක්වීමට ය.
(2) පරපරාගණය වැළැක්වීමට ය.
(3) ස්වපරාගණය ප්‍රවර්ධනය කිරීමට ය.
(4) අභිමත පරාගණයක් ලබා ගැනීමට ය.
(5) බාහිර පරාගවලින් අපවිත්‍ර වීම (Contamination) වැළැක්වීමට ය.

**17.** සංරක්ෂණ ගොවිතැන, පරිසර හිතකාමී වගා ක්‍රමයක් ලෙස සැලකේ. සංරක්ෂණ ගොවිතැනේ දී වල් පාලනය හොඳින් ම සිදු කළ හැක්කේ,
(1) බෝග මාරුව සහ අතුරු බෝග වගාව මගිනි.
(2) ජල ජීවී වගාව සහ මිශ්‍ර බෝග වගාව මගිනි.
(3) ඒක බෝග වගාව සහ පුරන් වීමට හැරීම මගිනි.
(4) බෝග මාරුව සහ වල් නාශක භාවිතය මගිනි.
(5) වල් නාශක භාවිතය සහ මිශ්‍ර බෝග වගාව මගිනි.

**18.** කාර්මික විප්ලවයේ සිට මිනිසා විසින් පෘථිවි වායුගෝලයට නිදහස් කර ඇති කාබන් ඩයොක්සයිඩ් සහ අනෙකුත් හරිතාගාර වායු ප්‍රමාණය ඉහළ යාම නිසා එමගින් රඳවා ගනු ලැබූ අතිරේක තාපය මගින් දේශගුණයට බලපෑමක් ඇත. මෙම බලපෑම නම් කරනුයේ,
(1) එල් නිනෝ බලපෑම ලෙස ය. (2) ලා නිනෝ බලපෑම ලෙස ය.
(3) ස්වාභාවික හරිතාගාර [illegible]ැස්ම ලෙස ය. (4) ස්වාභාවික හරිතාගාර බලපෑම ලෙස ය.
(5) ඉවැඩි හරිතාගාර බලපෑම ලෙස ය.

**19.** දර්ශීය පාංශු පැතිකඩක් රූපයෙහි දැක්වේ. ඛනිජ ක්ෂීරණය වැඩි හා අඩ වශයෙන් විවර්තනය වූ මාතෘ ද්‍රව්‍ය අඩංගු කලාප වන්නේ පිළිවෙළින්,




(1) O හා A ය.
(2) A හා B ය.
(3) A හා C ය.
(4) B හා C ය.
(5) B හා R ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**20.** බෝග ක්ෂේත්‍රයකට පොහොර යෙදීමේ අවස්ථාව පහත කරුණු මත රඳා පවතින බව ශිෂ්‍යයකු සඳහන් කර ඇත.

A - බෝග වර්ධක අවධිය
B - පාංශු තෙතමනය
C - පාංශු ආකාරය

ඉහත කරුණු අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

**21.** පහත පොහොර අතුරෙන් වඩාත් සාන්ද්‍ර වූ බහුලව භාවිත වන ඝන නයිට්‍රජන් පොහොර වනුයේ,

(1) යූරියා ය. (2) ඇමෝනියා ය.
(3) ඇමෝනියම් සල්ෆේට් ය. (4) ඇමෝනියම් නයිට්‍රේට් ය.
(5) ඩයිඇමෝනියම් පොස්ෆේට් ය.

**22.** බෝග ක්ෂේත්‍රයක ගුණාංග කිහිපයක් පහත දැක්වේ.

A - සච්ඡිද්‍රතාව
B - දෘශ්‍ය ඝනත්වය
C - ජල සන්නායකතාව
D - ශාක සංයුතිය

ඉහත ගුණාංග අතුරෙන් බිම් සැකසීම නිසා වෙනස් වන පාංශු භෞතික ගුණාංග වනුයේ,

(1) A හා B පමණි. (2) C හා D පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D සියල්ල ම ය.

**23.** කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රමාණයට වඩා වැඩි බීජ වී ප්‍රමාණයක් වැපිරීමට ගොවියකු විසින් තීරණය කරන ලදී. ඔහුගේ තීරණයට වඩාත් බලපෑ හේතුව විය හැක්කේ,

(1) සංයුක්ත නෙළන යන්ත්‍ර භාවිතයට පහසුවක් ලෙස ය.
(2) පොහොර ලෙස යෙදූ පෝෂක හානිය අවම කිරීම ය.
(3) පඳුරු දැමීම අඩු කර ඵලදායි පඳුරු සංඛ්‍යාව වැඩි කිරීම ය.
(4) දීර්ඝ කාලීනව පවතින ජල ගැලීම් හා නියං නිසා වන හානිය අවම කර ගැනීම ය.
(5) රෝග හා පළිබෝධ නිසා අහිමි වන ධාන්‍ය අස්වැන්න හානිපූරණය කිරීම ය.

● ප්‍රශ්න අංක **24** සහ **25** ට පිළිතුරු සැපයීම සඳහා පහත වාරි තාක්ෂණ ක්‍රම යොදා ගන්න.

A - පිටාර ජල සම්පාදනය
B - කළගෙඩි ජල සම්පාදනය
C - බිංදු ජල සම්පාදනය
D - විසිරුම් ජල සම්පාදනය

**24.** ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පොල් වගා කිරීම සඳහා වඩාත් සුදුසු වාරි තාක්ෂණ ක්‍රම වනුයේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) B හා D පමණි.
(4) C හා D පමණි. (5) B, C හා D පමණි.

**25.** මිරිස් වගාව සඳහා වඩාත් සුදුසු වාරි තාක්ෂණ ක්‍රමය/ක්‍රම වනුයේ,

(1) A පමණි. (2) D පමණි. (3) A හා D පමණි.
(4) B හා C පමණි. (5) C හා D පමණි.

**26.** ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කෘෂිකාර්මික භූමියක් සඳහා ජලය සැපයීමට වාරි ඇළ පද්ධතියක් ස්ථාපනය කිරීමට වාරි ඉංජිනේරුවරයෙක් තීරණය කරයි. වාරි ඇළ මාර්ග සාමාන්‍යයෙන් ස්ථාපනය කළ යුත්තේ,

(1) බෑවුම දිගේ ය. (2) වැටි දිගේ ය. (3) නිම්නය දිගේ ය.
(4) සමෝච්ච දිගේ ය. (5) කුඹුරු දිගේ ය.

**27.** පාලිත පාරිසරික තත්ත්ව යටතේ සිදු කරන කෘෂිකර්මය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) ස්වපරාගිත ශාක පොලිතීන් උමං තුළ වගා කළ **නොහැකි ය.**
(2) පොලිතීන් උමගක් තුළ උෂ්ණත්වය පාලනය කළ හැකි නමුත් RH පාලනය කළ **නොහැකි ය.**
(3) නිර්පාංශු වගාවක වගා මාධ්‍යය, දියර හෝ ඝන විය හැකි ය.
(4) වායව පරිසර තත්ත්ව යාමනය කළ **නොහැකි ය.**
(5) නිර්පාංශු වගාවක දී පෝෂණ මාධ්‍යයේ pH පවත්වා ගැනීම, EC පවත්වා ගැනීමට වඩා වැදගත් ය.

**28.** කැල්සියම් අත්‍යවශ්‍ය ශාක පෝෂකයක් ලෙස සලකනු ලබන්නේ එය,

(1) සෛල බිත්තිවල සංඝටකයක් වන නිසා ය.
(2) හරිතප්‍රදවල සංඝටකයක් වන නිසා ය.
(3) ඇමයිනෝ අම්ලවල සංඝටකයක් වන නිසා ය.
(4) සහඑන්සයිමවල සංඝටකයක් වන නිසා ය.
(5) ADP හා ATP වල සංඝටකයක් වන නිසා ය.

[හතරවැනි පිටුව බලන්න.

**29.** ශාකවල ශ්වසනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) සවායු සහ නිර්වායු ශ්වසන දෙකෙහි දී ම ඔක්සිජන් භාවිත වේ.
(2) ශ්වසනයේ දී එක් ග්ලූකෝස් අණුවක් භාවිතයෙන් කිලෝ කැලරි 10 000 ක් නිදහස් වේ.
(3) සවායු ශ්වසනයේ දී එක් ග්ලූකෝස් අණුවක් භාවිතයෙන් ATP අණු 38 ක් නිපද වේ.
(4) සවායු හා නිර්වායු ශ්වසන දෙක ම ශාක හෝර්මෝන මගින් යාමනය වේ.
(5) කාබන් ඩයොක්සයිඩ්, ඊතයිල් මධ්‍යසාරය හා ප්‍රොපියොනික් අම්ල යනු නිර්වායු ශ්වසනයේ අතුරුඵල වේ.

● ප්‍රශ්න අංක **30** සහ **31** ට පිළිතුරු සැපයීම සඳහා පහත වල් පැළ නාම යොදා ගන්න.

A - *Echinochloa crus-galli*
B - *Cyperus iria*
C - *Leptochloa chinensis*
D - *Ischaemum rugosum*
E - *Fimbristylis miliacea*

**30.** පොඒසියේ කුලයට අයත් වල් පැළ වනුයේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා E පමණි.

**31.** $C_4$ ප්‍රභාසංශ්ලේෂණය සහිත වල් පැළ වනුයේ,
(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) A, C හා E පමණි.
(4) B, C හා D පමණි. (5) B, C හා E පමණි.

● ප්‍රශ්න අංක **32** සහ **33** ට පිළිතුරු සැපයීම සඳහා පහත කෘමි ගෝත්‍ර යොදා ගන්න.

A - ලෙපිඩොප්ටෙරා
B - ඩිප්ටෙරා
C - කෝලියොප්ටෙරා
D - හෝමොප්ටෙරා
E - හෙමිප්ටෙරා

**32.** පූර්ණ රූපාන්තරණය දක්වන කෘමීන් අයත් ගෝත්‍ර වනුයේ,
(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) A, D හා E පමණි.
(4) B, C හා D පමණි. (5) B, D හා E පමණි.

**33.** විද යුෂ උරා බොන මුඛ කොටස් සහිත කෘමීන් අයත් ගෝත්‍ර වනුයේ,
(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) A, D හා E පමණි.
(4) B, C හා D පමණි. (5) B, D හා E පමණි.

● ප්‍රශ්න අංක **34** සහ **35** ට පිළිතුරු සැපයීම සඳහා පහත රෝග යොදා ගන්න.

A - මුල් තැම්බෙන රෝගය (Damping off)
B - රබර්වල සුදු මුල් රෝගය (White root disease of Rubber)
C - කැරට් මෘදු කුණු වීම (Soft rot in Carrot)
D - බුලත්වල පත්‍ර ලප රෝගය (Leaf spot disease in Betel)

**34.** බැක්ටීරියානු රෝග සඳහා උදාහරණ වනුයේ,
(1) A හා B පමණි. (2) B හා D පමණි. (3) C හා D පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි.

**35.** පාංශු ජනිත රෝග සඳහා උදාහරණ වනුයේ,
(1) A හා B පමණි. (2) B හා D පමණි. (3) C හා D පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි.

**36.** තෙළාගත් වී ගබඩා කිරීමට පෙර නිසි පරිදි වියළා **නොගැනීම** නිසා පහත කරුණු හේතු කොටගෙන පසු අස්වනු හානි සිදු වන බව ශිෂ්‍යයෙක් ප්‍රකාශ කරයි.
A - කෘමි ආසාදන
B - දිලීර ආසාදන
C - ප්‍රරෝහණය
ඉහත පිළිතුරු අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි. (5) B හා C පමණි.

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



- ප්‍රශ්න අංක **37** ට පිළිතුරු සැපයීම සඳහා පහත වගන්ති යොදා ගන්න.

A - කෘෂි වන වගා පද්ධතිය
B - ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම
C - බෝග හා ගොවිපොළ සතුන් සංයෝජනය
D - ආදායම් ඉපයීම

**37.** ඉහත වගන්ති අතුරෙන් ගෙවතු වගාවක ලක්ෂණ වඩාත් හොඳින් විස්තර වන්නේ,
(1) A හා D මගින් පමණි.
(2) A, B හා C මගින් පමණි.
(3) A, C හා D මගින් පමණි.
(4) B, C හා D මගින් පමණි.
(5) A, B, C හා D සියල්ල ම මගිනි.

**38.** සංයුක්ත ඒකාක්ෂ හට ගන්නා අවස්ථාවේ දී වී වගාවට නයිට්‍රජන් පොහොර යෙදීම වැදගත් වන්නේ,
(1) පුෂ්ප මූලාකෘති හට ගැනීම වැඩි කිරීමට ය.
(2) ප්‍රජනක අවධියේ දී පඳුරු හට ගැනීම වැඩි කිරීමට ය.
(3) තෘතීයික පඳුරුවල ප්‍රභාසංශ්ලේෂණය වැඩි කිරීමට ය.
(4) ධජ පත්‍රයේ ප්‍රභාසංශ්ලේෂණ ධාරිතාව වැඩි කිරීමට ය.
(5) පරිණත අවස්ථාවේ දී වී ශාක වල් පැළ සමග තරග කිරීම වැඩි කිරීමට ය.

**39.** ශ්‍රී ලංකාව තුළ ෆ්‍රීසියන් දෙනුන් යොදා ගනිමින් කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ඉහළ ම විභවයක් ඇත්තේ,
(1) වියළි කලාපයේ ය.
(2) උඩරට ය.
(3) මැදරට ය.
(4) පොල් ත්‍රිකෝණයේ ය.
(5) පහත රට තෙත් කලාපයේ ය.

**40.** නිසි අභිජනන වැඩපිළිවෙළකට පසු පැටවුන් මනාව පාලනය කිරීම නිසා දේශීය ගවයන්ගේ කිරි නිෂ්පාදනය වැඩි වීමට හේතු ගුරුතුමියක විසින් ශිෂ්‍යයකුගෙන් විමසන ලදී. ශිෂ්‍යයා විසින් පහත හේතු ඉදිරිපත් කරන ලදී.

A - අභිජනනය මගින් දේශීය ගවයන්ගේ ප්‍රවේණික විභවය වැඩි දියුණු වී ඇත.
B - අභිජනන වැඩසටහනෙන් පසුව සතුන් පරිසරයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරගෙන වැඩිපුර නිෂ්පාදනය කරයි.
C - ඉහළ කිරි නිෂ්පාදනයකට දායක වන ප්‍රධාන සාධකය මනා පාලනයයි.

ඉහත හේතු අතුරෙන් නිවැරදි විය හැකි වන්නේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) A හා C පමණි.

**41.** ගොවිපොළ සතුන් සඳහා වූ සාන්ද්‍ර ආහාර මිශ්‍රණවල ශක්ති පරිපූරක ලෙස යොදා ගත හැකි කෘෂි කර්මාන්ත අතුරුඵල සඳහා උදාහරණ කිහිපයක් වනුයේ,
(1) සහල් නිවුඩු (polish), මොලැසස් හා කැඩුණු සහල් ය.
(2) සහල් නිවුඩු (bran), පොල් පුන්නක්කු හා තිරිඟු නිවුඩු ය.
(3) කටුපොල් මද තෙල් අන්නය, සහල් නිවුඩු (polish) හා මොලැසස් ය.
(4) කරවල කුඩු, සෝයා බෝංචි අන්නය හා ඉවතලන විස්කෝතු ය.
(5) බඩ ඉරිඟු, පොල් පුන්නක්කු සහ කුකුල් අතුරුඵල අන්නය ය.

**42.** ගොවිපොළ සතුන්ගේ ආහාර ජීරණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - තන්තු ජීරණය සැම විට ම ක්ෂුද්‍රජීවී පැසීම සමග සම්බන්ධ ය.
B - සරල ආමාශයික හා රෝමාන්තක යන සතුන් දෙවර්ගයේ ම එන්සයිමීය ජීරණය සිදු වේ.
C - යාන්ත්‍රික ජීරණය, ක්ෂුද්‍රජීවී ජීරණය වැඩි කරන නමුත් එන්සයිමීය ජීරණය වැඩි **නොකරයි**.

ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A, B හා C සියල්ල නිවැරදි ය.
(2) A නිවැරදි නමුත් B හා C නිවැරදි **නොවේ**.
(3) A හා B සැම විට ම නිවැරදි වන අතර C සැම විට ම නිවැරදි **නොවේ**.
(4) B පමණක් නිවැරදි වන අතර එය සරල ආමාශයික හා රෝමාන්තක සතුන් අතර සමානත්වය පැහැදිලි කරයි.
(5) A හා B දෙක ම නිවැරදි වන අතර එය සරල ආමාශයික හා රෝමාන්තක සතුන් අතර වෙනස පැහැදිලි කරයි.

**43.** පහත ප්‍රකාශ අතුරෙන් ගවයකුගේ සංකීර්ණ ආමාශය පිළිබඳ ව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) සංකීර්ණ ආමාශය තුළ ක්ෂුද්‍රජීවී ජීරණය සිදු වන්නේ රූමනයේ පමණි.
(2) සංකීර්ණ ආමාශය, වාෂ්පශීලී මේද අම්ල අවශෝෂණය කරන ස්ථානයක් ලෙස ද ක්‍රියා කරයි.
(3) සංකීර්ණ ආමාශය තුළ එන්සයිම ස්‍රාවය **නො වන** බැවින් එහි එන්සයිමීය ජීරණයක් සිදු **නොවේ**.
(4) ව්‍යුහාත්මකව වෙනස් වුවත් ක්‍රියාකාරිත්වයෙන් සංකීර්ණ ආමාශය හා සරල ආමාශය සමාන ය.
(5) සංකීර්ණ ආමාශයේ විශාල ම කුටීරය රූමනය වන අතර කුඩා ම කුටීරය විතංශිකාව වේ.

**44.** ශ්‍රී ලාංකික නිරෝගී පිරිමි වැඩිහිටියකු සඳහා වඩාත් සුදුසු දිවා ආහාර ලේඛනය වන්නේ,

(1) ප්‍රධාන ආහාරය: බත්, පරිප්පු ව්‍යංජනය, බැදපු මාළු, සෝයා මීට් ව්‍යංජනය හා
අතුරුපස මී කිරි
(2) ප්‍රධාන ආහාරය: බත්, පොල් සම්බෝල, තැම්බූ බිත්තරයක්, පරිප්පු ව්‍යංජනය හා
අතුරුපස ජෙලි
(3) ප්‍රධාන ආහාරය: බත්, බතල ව්‍යංජනය, පරිප්පු ව්‍යංජනය, තැම්බූ බිත්තරයක් හා
අතුරුපස යෝගට්
(4) ප්‍රධාන ආහාරය: බත්, බැදපු අර්තාපල්, වම්බොටු ව්‍යංජනය, එළවලු සලාදය හා
අතුරුපස අයිස් ක්‍රීම්
(5) ප්‍රධාන ආහාරය: බත්, බැදපු බිත්තරයක්, කොළ එළවලු සලාදය, වට්ටක්කා ව්‍යංජනය
අතුරුපස පලතුරු සලාදය

**45.** ශ්‍රී ලංකා ආහාර ප්‍රමිති පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය SLS සැකසීම සඳහා වගකියන ආයතනවලින් එකකි.
B - ශ්‍රී ලංකා ආහාර ප්‍රමිති සියල්ල අනිවාර්ය **නොවේ**.
C - සමහර ශ්‍රී ලංකා ආහාර ප්‍රමිතීන් රෙගුලාසි ලෙස සැලකේ.
D - ශ්‍රී ලංකා ප්‍රමිතීන් මගින් ගුණාත්මය, ආරක්ෂාව සහ පාරිභෝගික අපේක්ෂා සහතික කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) A, B හා C පමණි. (5) B, C හා D පමණි.

**46.** ලොකු ළූනු කිලෝග්‍රෑමයක මිල රු. 60.00 සිට රු. 90.00 දක්වා වැඩි වීම හේතුවෙන් ලොකු ළූනු සැපයුම කිලෝග්‍රෑම් 40,000 සිට කිලෝග්‍රෑම් 50,000 දක්වා වැඩි වී ඇත. ඉහත තත්ත්වයට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) සැපයුමේ මිල නම්‍යතාව 0.6 හා සැපයුම අනම්‍ය වේ.
(2) සැපයුමේ මිල නම්‍යතාව 0.5 හා සැපයුම නම්‍ය වේ.
(3) සැපයුමේ මිල නම්‍යතාව 2.0 හා සැපයුම නම්‍ය වේ.
(4) සැපයුමේ මිල නම්‍යතාව 0.5 හා සැපයුම අනම්‍ය වේ.
(5) සැපයුමේ මිල නම්‍යතාව 2.0 හා සැපයුම අනම්‍ය වේ.

**47.** අන්නාසිවල ඉල්ලුම් වක්‍රය $P = 100 - 2Q_d$ වන අතර එහි $P$ යනු මිල (රු./කි.ග්‍රෑ.) හා $Q_d$ යනු ඉල්ලුම් කළ ප්‍රමාණය (කි.ග්‍රෑ. මිලියන) වේ. සැපයුම් වක්‍රය $P = 3Q_s$ වන අතර එහි $Q_s$ යනු සැපයුම් ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලියන) වේ. අන්නාසිවල සමතුලිත මිල වනුයේ,

(1) රු. 20.00 කි. (2) රු. 50.00 කි. (3) රු. 60.00 කි. (4) රු. 100.00 කි. (5) රු. 120.00 කි.

**48.** එක්තරා බ්‍රොයිලර් ගොවිපොළක කෙටි කාලීන සාමාන්‍ය පිරිවැය ($AC$) (රු./කි.ග්‍රෑ.), $AC = 40 + 2Q$ වන අතර එහි $Q$ යනු නිමැයුම (කි.ග්‍රෑ.) වේ. මෙම ගොවිපොළෙහි ස්ථාවර පිරිවැය වනුයේ,

(1) බිංදුවකි. (2) රු. 10.00 කි. (3) රු. 20.00 කි. (4) රු. 40.00 කි. (5) රු. 60.00 කි.

**49.** ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයෙන් ලැබෙන දායකත්වය (රු. මිලියනවලින්) පසුගිය වසර කීපය තුළ දී පහත වැටී ඇත.
B - කෘෂිකර්මයේ යෙදෙන ජනතාව ප්‍රතිශතයක් වශයෙන් වසර ගණනාවක් තුළ දී අඩු වී ඇත.
C - වසර ගණනාවක් තුළ දී කෘෂිකාර්මික ආනයන සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වැඩි වී ඇත.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි විය හැකි වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) B හා C පමණි.

**50.** කෝපිවලට ආසන්න ආදේශකයක් වන තේවල මිල වැඩි වන විට,

(1) කෝපිවල ඉල්ලුම් ප්‍රමාණය පහත වැටේ.
(2) කෝපිවල සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
(3) කෝපිවල ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.
(4) කෝපිවල ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.
(5) කෝපිවල සමතුලිත මිල හා ප්‍රමාණය වෙනස් **නොවේ**.

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

General Certificate of Education (Adv Level) Examination, August 2015

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව II<br>விவசாய விஞ்ஞானம் II<br>Agricultural Science II | 08 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

විභාග අංකය : ....................................

**උපදෙස් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **08** කින් සහ ප්‍රශ්න **10** කින් සමන්විත වේ.

※ මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස – ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 7)**

※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.

※ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස – රචනා (පිටු අංක 8)**

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

※ ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (08) කෘෂි විද්‍යාව - II | | |
|---|---|---|
| **කොටස** | **ප්‍රශ්න අංකය** | **ලැබූ ලකුණු** |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| **එකතුව** | | |
| **ප්‍රතිශතය** | | |

| **අවසාන ලකුණු** | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

[දෙවැනි පිටුව බලන්න

**A කොටස - ව්‍යුහගත රචනා**
**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)

1. (A) ප්‍රශ්න අංක (i) සිට (iii) තෙක් පිළිතුරු සැපයීමට දී ඇති රූප සටහන යොදා ගන්න.




(i) මෙම උපකරණය නම් කරන්න.

(ii) **P** සහ **Q** නම් කරන්න.

**P** :

**Q** :

(iii) මෙම උපකරණයේ භාවිතය සඳහන් කරන්න.

(B) පසෙහි ඛනිජ වැනි පාංශු සංඝටක මනා ලෙස කළමනාකරණය කිරීමෙන් බෝග ඵලදායිතාව වැඩි කළ හැකි ය.

(i) ප්‍රධාන මැටි ඛනිජ කාණ්ඩ **දෙක** නම් කරන්න.

(1) ..........

(2) ..........

(ii) මැටි ඛනිජවල ගුණාංග **තුනක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(iii) මන්සල් වර්ණ වගුව මගින් පසක වර්ණය තීරණය කිරීමට යොදා ගන්නා නිර්ණායක **තුනක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(3)

(C) මුළු ශාක පටකවලින් 95% ක් පමණ සාදනු ලබන ශාක පෝෂක **තුන** නම් කරන්න.

(i) ..........

(ii) ..........

(iii)

(D) ප්‍රශ්න අංක (i) සිට (v) තෙක් පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදා ගන්න.



(i) මෙම ව්‍යුහය නම් කරන්න.

..........

(ii) පොලිතීන් බෑගයේ පත්‍ර නොගෑවෙන සේ අතු කැබලි බඳුන්ගත කරන ලෙස කෘෂිකර්ම ගුරුතුමිය විසින් සිසුන්ට උපදෙස් දෙන ලදී. මෙම උපදෙසට හේතුව කුමක් ද?

..........

..........

..........

(iii) අතු කැබලිවල පත්‍රවලින් අඩක් කපා දමා ඇත්තේ කුමක් නිසා ද?

..........

..........

[තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මෙම තීරුයේ කිසිවක් නොලියන්න

(iv) එක් එක් පත්‍රයේ අඩක් ඉතිරි කරන ලද්දේ කුමක් නිසා ද?

(v) මෙම ව්‍යුහය සඳහා පාරදෘශ්‍ය පොලිතීන් බෑගයක් යොදා ගැනීමට හේතුව කුමක් ද?

(E) ගොවියෙක් සිය ක්ෂේත්‍රයට යොදන කෘත්‍රිම නයිට්‍රජන් පොහොර ප්‍රමාණය 20% කින් අඩු කිරීමට තීරණය කළේ ය.

(i) කෘත්‍රිම නයිට්‍රජන් පොහොර යෙදීම අඩු කිරීමෙන් අත්වන බලපෑම අවම කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා යොදාගත හැකි ප්‍රාදේශීයව සපයා ගත හැකි ආදේශක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ii) ක්ෂේත්‍රයේ පහසුවෙන් හඳුනාගත හැකි ප්‍රධාන නයිට්‍රජන් ඌනතා ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2)

(iii) බෝග ක්ෂේත්‍රවලට වැඩිපුර නයිට්‍රජන් පොහොර යෙදීමෙහි අවාසියක් සඳහන් කරන්න.

2. (A) ගොවිපොළ සතුන්ගේ ප්‍රවේණික විභවය වැඩි දියුණු කිරීමට යොදා ගන්නා අභිජනන ක්‍රමයක් ලෙස 'වරණය' සැලකේ. ගොවිපොළ සතුන් සාර්ථක ව වරණය කිරීම සඳහා යොදා ගන්නා ගොවිපොළ වාර්තා ආකාර **දෙකක්** ලැයිස්තුගත කරන්න.


(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

(B) පහත එක් එක් සතකුගේ යාන්ත්‍රික ජීර්ණය සිදු වන ප්‍රධාන ස්ථානය නම් කරන්න.

| **සතුන් විශේෂය** | **යාන්ත්‍රික ජීර්ණය සිදු වන ප්‍රධාන ස්ථානය** |
|---|---|
| (i) කුකුළන් | |
| (ii) ගවයන් | |

(C) ප්‍රශ්න අංක (i) සිට (iv) තෙක් පිළිතුරු සැපයීමට පහත දක්වා ඇති කිකිළි බිත්තරයක රූප සටහන යොදා ගන්න.




P, Q, R, S කොටස් නම් කර ඒ එක එකක වැදගත් කාර්යය බැගින් සඳහන් කරන්න.

| **කොටසේ නම** | **වැදගත් කාර්යය** |
|---|---|
| (i) P | |
| (ii) Q | |
| (iii) R | |
| (iv) S | |

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(D) හොඳින් බිත්තර දමන කිකිළියකගේ පහත සඳහන් දේහ කොටස්වල බාහිර පෙනුම දක්වන්න.

**දේහ කොටස** **පෙනුම**

(i) කරමල

(ii) ජම්බාලිය

(ii) නෞතලය හා
ශ්‍රෝණි අස්ථි අතර දුර

(iv) ඇස්

(E) සත්ත්ව ගොවිපොළවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ගොවිපොළ සතුන්ගේ ආසාදනය නො වන රෝග පාලනය වැදගත් වේ. ආසාදනය **නො වන** රෝග ඇති කරන සාධක **හතරක්** සඳහන් කරන්න.

(i) ...........................................................................................

(ii) ...........................................................................................

(iii)

(iv)

(F) කිරි ගොවිපොළක ගොවිපොළ අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ක්‍රමයක් සඳහන් කරන්න.

(G) දෙනකගේ පහත එක් එක් ක්‍රියාකාරිත්වය සඳහා බලපාන හෝමෝනය නම් කරන්න.

(i) කිරි එරීම

(ii) ගර්භිණී බව පවත්වාගෙන යාම

(H) ආහාර සංරක්ෂණය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රම පහත දැක්වේ. එක් එක් ක්‍රමයේ සිදු විය හැකි එක් සංරක්ෂණ ක්‍රියාවක් බැගින් සඳහන් කරන්න.

(i) මාළු දුම් ගැසීම

(ii) මස් මී පැණිවල ගිල්වීම

(iii) ලුණු දෙහි දැමීම

(iv) ඇට වර්ග වියළි වැලිවල ගබඩා කිරීම :...........................................................................

(I) පලතුරුවල පසු අස්වනු හානිවලට සෘජුව ම බලපාන්නා වූ පූර්ව අස්වනු ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාමාර්ගයක් හා එම පසු අස්වනු හානියේ ස්වභාවය සඳහන් කරන්න.

**ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාමාර්ගය** **අදාළ පසු අස්වනු හානිය**

(i) ........................................................ (ii) ........................................................

3. (A) ප්‍රශ්න අංක (i) සිට (iii) තෙක් පිළිතුරු සැපයීමට පහත වගුවේ සඳහන් දත්ත යොදා ගන්න.

| මුළු පාංශු නියැදියේ වාතයේ වියලූ බර (g) | නියැදියේ මි.මී. 2.00 ට වඩා කුඩා අංශු අඩංගු කොටස වාතයේ වියලූ බර (g) | නියැදියේ මි.මී. 2.00 ට වඩා කුඩා අංශු අඩංගු කොටස් උදුනේ වියලූ බර (g) | මුළු නියැදියේ පරිමාව ($cm^3$) | අංශු ඝනත්වය ($g/cm^3$) |
|---|---|---|---|---|
| 325 | 290 | 275 | 190 | 2.63 |

(i) මෙම පාංශු නියැදියේ රළු කොටස (අංශු ප්‍රමාණය මි. මී. 2.00 ට වඩා වැඩි) මුළු නියැදියේ ප්‍රතිශතයක් ලෙස ගණනය කර දක්වන්න.

(ii) දෘශ්‍ය ඝනත්වය ගණනය කරන්න.

[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) සච්චරතාව ගණනය කරන්න.

.......................................................................................................

(B) ශාක හෝමෝන මගින් ශාක වර්ධනය යාමනය කරයි.

(i) ශාක හෝමෝන හා ශාක වර්ධක යාමක අතර ප්‍රධාන වෙනස කුමක් ද?

.......................................................................................................

(ii) අග්‍රස්ථ ප්‍රමුඛතාව ඇති කිරීමේ දී ඔක්සින්වල කාර්යභාරය කුමක් ද?

.......................................................................................................


(iii) පල ඉදීමට උපකාරී වන ශාක හෝමෝනය නම් කරන්න.

(iv) වාණිජ ව ලබාගත හැකි වර්ධක යාමක **දෙකක්** නම් කරන්න.

(1) .......................................................................................................

(2) .......................................................................................................

(C) පහත රූප සටහනේ දැක්වෙන උපකරණය කෘෂිකාර්මික ඉඩම් සැකසීමට යොදා ගනී.



(i) ඉහත උපකරණය නම් කරන්න.

.......................................................................................................

(ii) ඉහත උපකරණය භාවිතයෙන් බිම් සැකසීමේ අරමුණු **තුනක්** සඳහන් කරන්න.

(1) .......................................................................................................

(2) .......................................................................................................

(3) .......................................................................................................

(D) බෝග ක්ෂේත්‍රවලට ජල සම්පාදනය කිරීමේ දී බොහෝ සාධක සලකා බලනු ලැබේ.

(i) බෝගයක වාරි අවශ්‍යතාව නිර්ණය කිරීම සඳහා යොදා ගැනෙන ශාක සම්බන්ධ සාධක **හතරක්** ලැයිස්තුගත කරන්න.

(1) .......................................................................................................

(2) .......................................................................................................

(3) .......................................................................................................

(4) .......................................................................................................

(ii) බෝග නිෂ්පාදනය සඳහා වාරි සම්පාදනය කිරීමට ජල ප්‍රභවයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** ලැයිස්තුගත කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(E) ප්‍රභාසංශ්ලේෂණයට ශාක මෙන් ම ශාක **නො වන** සාධක ද බලපායි. ප්‍රභාසංශ්ලේෂණයට අවශ්‍ය ශාක **නො වන** සාධක **තුනක්** ලැයිස්තුගත කරන්න.

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

(iii)

(F) පහත සඳහන් වදන් අර්ථ දක්වන්න.

(i) නාගරික කෘෂිකර්මය

..........................................................................................................

(ii) සාම්ප්‍රදායික කෘෂිකර්මය

(G) ඩැපොග් තවානකින් ලබාගත් පැළ සිටුවීමට සංසන්දනාත්මක ව පැරශුට් ක්‍රමයට වී බෝගය සංස්ථාපනය කිරීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

4. (A) ශ්‍රී ලංකාවේ කුඹුරුවල දක්නට ලැබෙන ප්‍රධාන වල් පැළෑටි කාණ්ඩ තුන පහත රූප සටහනේ දැක්වේ.



P Q R

(i) ප්‍රධාන වල් පැළෑටි කාණ්ඩ **තුන** නම් කරන්න.

(1) P : ..........................................................................................................

(2) Q :

(3) R :

(ii) වල් පැළෑටි කාණ්ඩ තුන වෙන් කර හඳුනාගැනීම සඳහා එක් එක් කාණ්ඩයට ලක්ෂණ **දෙක** බැගින් සඳහන් කරන්න.

(1) 'P' වල් පැළෑටි කාණ්ඩය

(*a*) ..........................................................................................................

(*b*) ..........................................................................................................

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(2) 'Q' වල් පැළෑටි කාණ්ඩය

(*a*) ..............................................................................................................

(*b*) ..............................................................................................................

(3) 'R' වල් පැළෑටි කාණ්ඩය

(*a*) ..............................................................................................................

(*b*) ..............................................................................................................

(iii) එක් එක් වල් පැළෑටි කාණ්ඩයට අයත් වන හා මඩ වී වගාවේ දී කරදරකාරී වන වල් පැළෑටියක් බැගින් නම් කරන්න.

(1) 'P' වල් පැළෑටි කාණ්ඩය

(2) 'Q' වල් පැළෑටි කාණ්ඩය

(3) 'R' වල් පැළෑටි කාණ්ඩය

(B) පහත වදන් පිළිබඳ ව අර්ථ දක්වන්න.

(i) කෘෂි වන වගාව

(ii) සංරක්ෂණ කෘෂිකර්මය

(C) තාවකාලික වර්ධක ව්‍යුහ, ගෙවතු වගාවේ දී බහුලව යොදා ගැනේ. තාවකාලික වර්ධක ව්‍යුහ භාවිතයේ **එක්** වාසියක් හා **එක්** අවාසියක් සඳහන් කරන්න.

(i) වාසිය :..............................................................................................................

(ii) අවාසිය :..............................................................................................................

(D) කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී යෙදවුම් හා නිමැයුම් අතර සම්බන්ධතා තුනක් දක්නට ලැබේ. මේවා ශ්‍රිතයක් හෝ වක්‍රයක් හෝ ලෙස නිරූපණය කළ හැකි අතර, මෙම ශ්‍රිතයන්ගේ බෑවුම නිෂ්පාදන තීන්දු ගැනීමට වැදගත් වන තොරතුරු ලබා දේ. කෘෂිකාර්මික නිෂ්පාදනයේ මෙම යෙදවුම් හා නිමැයුම් අතර සම්බන්ධතාවලට අදාළ ව පහත වගුවේ හිස්තැන් පුරවන්න.

| **සම්බන්ධතා ආකාරය** | **ශ්‍රිතයේ/වක්‍රයේ නම** | **ශ්‍රිතයේ/වක්‍රයේ බෑවුම** |
|---|---|---|
| (i) ........................... | (ii) ........................... | (iii) |
| (iv) | (v) ........................... | (vi) |
| (vii) | (viii) | (ix) |

21934



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

## B කොටස - රචනා

**උපදෙස් :**

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
※ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන්
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි.)

**5.** (i) බෝග නිෂ්පාදනය කෙරෙහි පාංශු ව්‍යුහය බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ii) බිත්තර රක්කවීමේ දී අවශ්‍ය වන ප්‍රධාන තත්ත්ව ලැයිස්තුගත කර ස්වාභාවික බිත්තර රක්කවීමට සාපේක්ෂ ව කෘත්‍රිම බිත්තර රක්කවීමේ වාසි හා අවාසි සඳහන් කරන්න.

(iii) මුඛ කොටස් පදනම් කරගෙන කෘමි පළිබෝධ වර්ගීකරණය කර, එක් එක් කෘමි පළිබෝධ කාණ්ඩය බෝගයට කරන හානිය පැහැදිලි කරන්න.

**6.** (i) පාංශු ආම්ලිකතාවට බලපාන සාධක විස්තර කරන්න.

(ii) ඝන ආස්තරණ කුකුළු නිවාස ඉදිකිරීමේ දී හා පාලනය කිරීමේ දී සලකා බැලිය යුතු වැදගත් සාධක විස්තර කරන්න.

(iii) නව ඉහළ අස්වනු දෙන වී ප්‍රභේදවලට සංසන්දනාත්මකව සාම්ප්‍රදායික වී ප්‍රභේද වගා කිරීමේ වාසි හා අවාසි පැහැදිලි කරන්න.

**7.** (i) ශ්‍රී ලංකාවේ විවිධ ආකාරයේ ඒකාබද්ධ වගා පද්ධති (Integrated Farming Systems) ලැයිස්තුගත කර පරිසරයට ඒවා මගින් ඇති කරන ධනාත්මක බලපෑම් පැහැදිලි කරන්න.

(ii) දෙනකගෙන් කිරි දෙවීමේ ප්‍රධාන පියවර නිවැරදි පිළිවෙළට පැහැදිලි කරන්න.

(iii) කුඹුරක් මඩ කිරීමේ හා මට්ටම් කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

**8.** (i) පසු අස්වනු හානි රටක ආහාර සුරක්ෂිතතාවට හා ආර්ථිකයට බලපාන ආකාරය විස්තර කර, ඉක්මනින් නරක් වන ද්‍රව්‍යවල පසු අස්වනු හානිය අවම කරන ආකාර සඳහන් කරන්න.

(ii) බිංදුමය හා විසිරි ජල සම්පාදන පද්ධති, වියළි කලාපයේ වගා ක්ෂේත්‍ර සඳහා යොදා ගැනීමේ දී ඇති වාසි හා අවාසි සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණයේ කාර්යක්ෂමතාව නැංවීම සඳහා යොදා ගත හැකි ක්‍රම මොනවා ද?

**9.** (i) ප්‍රවේණික සම්පත්වලට ඇති තර්ජන විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ බෝග නිෂ්පාදනයේ දී පොලිතීන් උමං යොදා ගැනීමේ වාසි පැහැදිලි කරන්න.

(iii) විවිධ බීජ ප්‍රතිකාරවල අරමුණු විස්තර කරන්න.

**10.** (i) නාගරික ප්‍රදේශවල ආහාර පුරුදුවල වෙනස් වීම් පාසල් ළමයින් අතර අධි පෝෂණයට දායක වන ආකාරය හා එහි ඵලවිපාක පැහැදිලි කරන්න.

(ii) කෘෂිකර්මයට විවිධ සේවා සපයන රාජ්‍ය ආයතන ලැයිස්තුගත කර එයින් **එකක** කාර්යභාරය හා වගකීම පැහැදිලි කරන්න.

(iii) ශාකවලට බනිජ අවශෝෂණය වන යාන්ත්‍රණ පැහැදිලි කරන්න.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

# 25% OFF ALL BOOKS

**Including Exercise Books, CR Books, and B5 Books**



**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

## ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**

# ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



# LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK